# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,923/3 — 1970 සැප්තැම්බර් 16 වැනි බදාදා — 1970.9.16

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

1970 අංක 296/4

අ. ආ. කා. අංක සී. 146/48.

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ලේකම්, එස්. එස්. විජේසිංහ මහතා දිවයිනට පෙරළා පැමිණෙන තුරු හෝ තවදුරටත් නියෝගයක් කරන තුරු හෝ 1970 සැප්තැම්බර් 16 වැනි දින සිට නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ලේකම් වශයෙන් වැඩ බැලීමට, නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සහකාර ලේකම්, එස්. එන්. සෙනෙවිරත්න මහතා අග්‍රාණ්ඩුකාරතුමන් විසින් පත් කරන ලද බව මෙයින් දනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඩී. ජී. දයාරත්න,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1970 සැප්තැම්බර් 16 වැනි දින
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්‍යාලයේදීය.

9–914

---

## මිළ පාලන දැන්වීම

සී 495 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය

අතිරේක ආහාර ද්‍රව්‍ය

### මිළ පාලන පනත

#### නියෝගය

මිළ පාලක (ආහාර) තැන්පත් චාර්ල්ස් එම්මැනුවෙල් හෙන්රි අමරසේකර වන මම, (173 වන අධිකාරය වන) මිළ පාලන පනතේ 4 වෙනි වගන්තියෙන් මිල පාලක (ආහාර) වෙත පැවරී තිබෙන බලතල අනුව :—

(1) 1970 අගෝස්තු 28 වෙනි දින අංක 14,920/7 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1970 අගෝස්තු 28 වෙනි දින අංක සී. 494 දරණ ආහාර මිළ නියෝගය මේ දුන් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) තවද, මීට යාකර ඇති උපලේඛණයේ 1 වෙනි තීරයේ සඳහන් එක් එක් ද්‍රව්‍යයක් මෙරටට ගෙන්වන්නෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දලබර හොණ්ඩරයක්ද, තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළබර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, කොළඹ නගරයේ නාගරික සීමාවන් ඇතුලත විකිණිය හැකි වැඩිම මිළ මේ දුන් පටන් මේ උපලේඛනයේ 2 වෙනි, හා 3 වෙනි හා 4 වෙනි තීරවල අනුපිළිවෙළින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්යය සඳහා—

(අ) උපලේඛණයේ 1 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍යයක ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උපලේඛණයේ 1 වෙනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට දළබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමකට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් ;

(ආ) උපලේඛණයේ සඳහන් යම් ද්‍රව්‍යයකින් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළබර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරණු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛණයේ 1 වෙනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එවැනි ද්‍රව්‍යයකින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍ය සඳහා මේ නියෝගයේ වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධකොට, එකී ද්‍රව්‍යය හා නියමිත වැඩිම මිළ ඕනෑම ගනුදෙනුකාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

686/7——ජේ 16879—11,700 (70/9)

(6) එසේම මෙම නියෝගයේ කාර්යය සඳහා " රාත්තල " හෙවත් " රා " යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛණයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා උපලේඛණයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුව හොත් පහත සඳහන් විස්තර එනම් —

(අ) විකුණූ දිනය :

(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුවයි) :

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල :

(ඈ) වෙළදාමේ ස්වභාවය එනම් වෙළදාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බව ද නියම කරමි.

(8) උපලේඛණයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍ය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම්, එහි මිළත් උපලේඛණයේ 2 වෙනි හා 4 වෙනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුළත් වන බව ද නියම කරමි.

සී. ටී. එච්. අමරසේකර,
මිළ පාලක (ආහාර).

1970 සැප්තැම්බර් 16 වෙනි දින පස්වරු 3.45 ට කොළඹ දී, අත්සන් කරන ලදී.

## උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය | 4 වැනි තීරය |
|---|---|---|---|
| වර්ගය | මෙරටට ගෙන්වන්නෙකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | තොග වෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| කොත්තමල්ලි ... ... ... ... | — | 82 0 | 0 84 |
| රතු ළූණු ... ... ... ... | — | 24 0 | 0 28 |
| ළූණු (රතු ළූණු හැර වෙනත් සියළුම වර්ග) ... ... | 32 50 | 34 0 | 0 38 |

සැළකිය යුතුයි.—(i) මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියම මිළ නොවේ. මෙවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ ගණන් ය. එම මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකියි.

(ii) මෙරටට ගෙන්වන්නෙකු විසින් අය කරන මිළ හොණ්ඩර 10 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකුණන විට අය කරන මිළ විය යුතුය.

9-915

---

අංක සී. 496 දරණ ආහාර මිළ නියෝගය | කිරි ආහාර

## මිළ පාලන පනත

### නියෝගය

මිළ (ආහාර) පාලක තැන්පත් චාර්ල්ස් එම්මැනුවෙල් හෙන්රි අමරසේකර වන මම, (173 වන අධිකාරය වන) මිළ පාලන පනතේ 4 වෙනි වගන්තියෙන් මිළ (ආහාර) පාලක වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1970 ජූලි මස 2 වෙනි දින අංක 14,912/7 දරණ ලංකාණ්ඩුවේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1970 ජූලි මස 1 වෙනි දින අංක සී. 492 දරණ ආහාර මිළ නියෝගය මේ දත් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) මිට යාකර ඇති උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් කර ඇති එක් එක් වර්ගයේ කිරි ආහාර ද්‍රව්‍ය තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී ටින් දුසිමක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් විකිණීමේදී ටින් එකක් ද විකිණිය හැකි වැඩිම මිළ මෙම උපලේඛණයේ 2 හා 3 වැනි තීරවල අනුපිළිවෙළින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව ද එම මිළ ගණන් ශ්‍රී ලංකා ද්වීපය ඇතුළත බල පැවැත්වෙන බවද මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යයක ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට ටින් දුසිමක් හෝ ඊට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ආ) උපලේඛනයේ සඳහන් යම් ද්‍රව්‍යයක් වරකට ටින් දුසිමකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එවැනි ද්‍රව්‍ය කිසි ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍ය සඳහා මේ නියෝගයෙන් නියමිත වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම් වලින් මිළ පුවරුවක සටහන් කොට එකී ද්‍රව්‍ය හා නියමිත වැඩිම මිළ ඕනෑම ගනුදෙනුකාරයෙකුට පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(6) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තකුම ද උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකුම ද විසින් මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය,

(ආ) එම ද්‍රව්‍යයන් විකුණූ ටින් ගණන හා එක ටින් එකක බර.

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල,

(ඈ) වෙළදාමේ ස්වභාවය, එනම් වෙළදාම තොග වශයෙන් ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

(7) උපලේඛනයේ 1වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍ය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් හෝ යම් භාජනයක බහාලනු ලැබේනම් එම එතුම් කොළයේ හෝ භාජනයේ මිළත් උපලේඛනයේ 2 හා 3 වැනි තීරවල සඳහන් උපරිම මිළ ගණන් වලට ඇතුළත් විය යුතු බව ද නියම කරමි.

1970 සැප්තැම්බර් 16 වැනි දින අපරභාග 3.45 ට කොළඹ දී අත්සන් කරන ලදී.

ඕ. ඊ. එච්. අමරසේකර,
මිළ පාලක (ආහාර).

## උපලේඛනය

| 1 වැනි තීරය<br>කිරි ආහාර වර්ගය | 2 වැනි තීරය<br>ටින් දුසිමක් විකිණිය හැකි උපරිම තොග මිළ<br>රු. ශ. | 3 වැනි තීරය<br>ටින් එකක් විකිණිය හැකි උපරිම සිල්ලර මිළ<br>රු. ශ. |
|---|---|---|
| ලැක්ටෝජන්—සකස් කළ හා සාරවත් කළ පිටිකිරි (ශුද්ධ බර රා. 1—ග්‍රෑම් 454) | 47 75 | 4 20 |
| ලැක්ටෝජන්—සකස් කළ හා සාරවත් කළ පිටිකිරි (ශුද්ධ බර රා. 2½—කි. ග්‍රෑ. 1.134) | 110 50 | 9 75 |
| ලැක්ටෝජන්—සකස් කළ හා සාරවත් කළ පිටිකිරි (ශුද්ධ බර රා. 5—කි.ග්‍රෑ. 2.268) | 192 0 | 16 80 |
| ලැක්ටෝජන්—සම්පූර්ණ ප්‍රෝටීන් විටමින් "ඒ" වලින් සාරවත් කළ ළදරුවන්ගේ ආහාරය පිණිස වූ කිරි ක්‍රමය (ශුද්ධ බර රා. 1—ග්‍රෑ. 454) | 47 75 | 4 20 |
| ලැක්ටෝජන්—සම්පූර්ණ ප්‍රෝටීන් විටමින් 'ඒ'වලින් සාරවත් කළ ළදරුවන්ගේ ආහාරය පිණිස වූ කිරි ක්‍රමය (ශුද්ධ බර රා. 2½—ග්‍රෑ. 1135) | 110 50 | 9 75 |
| පෙලාර්ගන්—ළදරු ආහාරය පිණිස වූ කිරි ක්‍රමය (ශුද්ධ බර රා. 1—ග්‍රෑ. 454) | 51 25 | 4 50 |
| පෙලාර්ගන්—ළදරු ආහාරය පිණිස වූ කිරි ක්‍රමය (ශුද්ධ බර රා. 2½—කි. ග්‍රෑ. 1.134) | 117 50 | 10 40 |
| නෙස්ටෝජන්—ළදරු කිරි ආහාරය (ශුද්ධ බර රා. 1—ග්‍රෑ. 454) | 50 10 | 4 45 |
| එලිඩන්—ඇසිඩ් බටර් කිරි (ශුද්ධ බර රා. ½—ග්‍රෑ. 227) | 29 13 | 2 60 |
| කව් ඇන්ඩ් ගේට් කිරි ආහාර (ශුද්ධ බර අවු. 30—ග්‍රෑ. 850) | 90 0 | 8 0 |
| කව් ඇන්ඩ් ගේට් කිරි ආහාර (ශුද්ධ බර අවු. 14—ග්‍රෑ. 396) | 45 0 | 4 0 |
| කව් ඇන්ඩ් ගේට්—අර්ධ යොදය සහිත කිරි ආහාරය (ශුද්ධ බර අවු. 12—ග්‍රෑ. 340) | 45 0 | 4 0 |
| ඔස්ටර් මිල්ක්—මිශ්‍රිත ළදරු කිරි ආහාරය (ශුද්ධ බර අවු. 32—ග්‍රෑ. 908) | 84 0 | 7 65 |
| ඔස්ටර් මිල්ක්—මිශ්‍රිත ළදරු කිරි ආහාරය (ශුද්ධ බර අවු. 16—ග්‍රෑ. 454) | 46 80 | 4 35 |
| එස්. එම්. ඒ.—ළදරුවන්ගේ සඳහා වූ කිරි ක්‍රමය (ශුද්ධ බර රා. 1) | 55 20 | 4 95 |
| එන්පර්මිල්—යකඩ සහිත ළදරු කිරි ක්‍රමය (ශුද්ධ බර රා. 1—ග්‍රෑ. 454) | 61 44 | 5 50 |
| එන්පර්මිල්—ළදරු කිරි ක්‍රමය (ශුද්ධ බර රා. 1—ග්‍රෑ. 454) | 61 44 | 5 50 |
| එන්පර්මිල්—පවුඩර්, ළදරුවන් සඳහා වූ කිරි ක්‍රමය (ශුද්ධ බර රා. 1—ග්‍රෑ. 454) | 61 44 | 5 50 |
| එන්පර්මිල්—(යකඩ සහිත) පවුඩර්, ළදරු කිරි ක්‍රමය (ශුද්ධ බර රා. 1—ග්‍රෑ. 454) | 61 44 | 5 50 |
| විටාමිල්ක්—ළදරුවන් සඳහා වූ මිශ්‍රිත කිරි ආහාරය (ශුද්ධ බර—රා. 1) | 37 50 | 3 20 |
| විටාමිල්ක්—ළදරුවන් සඳහා වූ මිශ්‍රිත කිරි ආහාරය (ශුද්ධ බර රා. 2½) | 84 12 | 7 20 |
| විටාමිල්ක්—ළදරුවන් සඳහා වූ මිශ්‍රිත කිරි ආහාරය (ශුද්ධ බර රා. 5) | 150 0 | 13 10 |
| මිල්කෝස්—ළදරු කිරි ආහාරය (ශුද්ධ බර රා. 1/අවු. 16 හෝ ග්‍රෑ. 454) | 48 50 | 4 20 |
| ලිටා—ළදරු කිරි ආහාරය (ශුද්ධ බර රා. 1—ග්‍රෑ. 454) | 44 50 | 4 0 |

සටහන:—(i) මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි උපරිම මිළ ගණන් වේ. ඒ මිළ ගණන්වලට ඉහළින් ඒ ඒ ද්‍රව්‍යය විකිණීමට නොහැකිය.

9—916

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.